කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

ජනසන්නිවේදනය - MACO - E 2025

සංවර්ධනය, ජනමාධ්‍ය භාවිතය, ආයතන හා සංවිධාන

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සංවර්ධන සන්නිවේදනය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? නිර්වචනය කර, පැහැදිලි කරන්න.

02. ''රටක සංවර්ධනය සඳහා ඒකායන මාර්ගයක් නොමැත.'' විවිධ සංවර්ධන ප්‍රවේශ හා පර්යාවලෝක ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු කලාපයේ රටවල සංවර්ධන ක්‍රියාමාර්ගයන්හිදී සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවලට වඩා නව මාධ්‍ය (අන්තර්ජාලය හා ජංගම දුරකථනය) කඩිනමින් භාවිතයට ගනු ලැබේ.'' මෙය සාධාරණ දැයි නිදර්ශන සහිතව විමසන්න.

04. ''ජනමාධ්‍යයන්හි සීඝ්‍ර ක්‍රියාකාරීත්වය සහ ව්‍යාප්තිය හේතු කොටගෙන ප්‍රජා මාධ්‍යයන් තවදුරටත් ග්‍රාමීය සංවර්ධනයෙහි ලා ඵලදායක නොවේ.'' මෙය ලාංකේය ප්‍රජා ගුවන්විදුලියෙහි ක්‍රියාකාරීත්වය ඇසුරෙන් විග්‍රහ කරන්න.

05. තිරසර සංවර්ධන ක්‍රියාමාර්ගයන්හිදී සහභාගීත්ව සංවර්ධන සන්නිවේදනයෙහි ඇති අදාළත්වය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. ග්‍රාමීය හෝ නාගරික හෝ ඒකාබද්ධිත හෝ යන සංවර්ධන ක්ෂේත්‍රයන්ගෙන් **එකක්** තෝරාගෙන, එයට උචිත සංවර්ධන සන්නිවේදන වැඩසටහනක් සකස් කරන්න.

07. ඔබ ජීවත්වන ප්‍රදේශයේ ක්ෂේත්‍ර සංවර්ධන නිලධාරිවරයා/වරිය ඔබ යැයි සිතන්න. ඔබගේ ආයතන ප්‍රධානියා ප්‍රදේශයේ සංවර්ධන ගැටළු හඳුනාගැනීමට ඔබගෙන් වාර්තාවක් ඉල්ලා සිටී. ඒ සඳහා උචිත සංවර්ධන පර්යේෂණ සැලැස්මක් සකස් කරන්න.

08. පහත සඳහන් ප්‍රකාශ දෙකෙන් **එකක්** පිළිබඳව සංවර්ධන විචාරයක් කරන්න.

''ලාංකේය සංවර්ධන වැඩසටහන්වල අරමුණු හා ප්‍රතිඵල ජාත්‍යන්තර සංවර්ධන ආයතනවල ඉලක්ක මත රඳා පවතී.''

නැතිනම්

''කෙටිකාලීන, පටු අවශ්‍යතා මෙන්ම ජාතික හා ජාත්‍යන්තර දේශපාලන බලපෑම් හේතුකොටගෙන සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධන ක්‍රමෝපාය සකස්ව තිබේ.''

******************************